පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

සතිය - 15

විෂයය:- කෘෂි හා ආහාර තාක්ෂණය

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

Department of Education,Sabaragamuwa Province/ Weekly School

පසුගිය සතියක මී ගවයින් පිළිබඳ තොරතුරු සෙවීම.

ඔබේ දැනුමට -- ලංකාවේ වාසය කරන ඔවුන් ආසියානු වගුරු ( swamp ) මී ගවයා ලෙසද හඳුන්වයි. හීලෑ කොටගෙන ගෘහාශ්‍රිත ව ඇති කරයි . සම්භවය ඉන්දියාව ආශ්‍රිත රටවල අග්නිදිග ආසියාව, චීනය. වර්තමානයේ යුරෝපය, ඕස්ට්‍රේලියාව, උ. ඇමරිකාව, සමහර අප්‍රිකානු රටවල වාසය කරයි. විශාල ගව පවුලේ එක් විශේෂයකි. swamp ( වගුරු) මී ගවයින් කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගනී. river buffalo වර්ගයෙන් කිරි සඳහා ඇතිකරනු ලබන මූරා, සූර්ති ගවයන් විකාශනය වේ.

8.3.2.- ආහාර සලාක පිළියෙල කිරීම.

1) සත්ව ආහාර සලාකයක් පිළියෙල කිරීමේදී සළකා බැලිය යුතු කරුණු මොනවාද ?

* පෝෂක ලබා දීම සඳහා භාවිත කරන ආහාර වර්ග කෙරෙහි අවධානය යොමු කරන්න.

2) සත්ව ආහාර සලාකයක තිබියයුතු පෝෂක සංඝටක අතර ඛනිජ වල වැදගත් කම අධ්‍යයනය කරන්න .(කැල්සියම් ගැන වැඩි අවධානයක් යොමු කරන්න )

* අඩංගු ආහාර,ඌණතා ලක්ෂණ වගුවක සම්පූර්ණ කරන්න.

* ගොවිපොලේදී සතුනට ඛණිජ අනිවාර්යයෙන් ලබා දිය යුතුයි. විමසන්න. ඒ සඳහා ගොවිපොල හිමිකරුවන් අනුගමනය කරන ක්‍රම මොනවාදැයි සොයා බලන්න.

8.3.3.සත්ව ආහාර වර්ගීකරණය

ගවයින්ට තෘණ (දළ)ආහාර ලබා දෙන්නේ ඔවුන්ගේ ජීව බරින් 10'/. යි.

1) දළ ආහාර හා සාන්ද්‍ර ආහාර හොඳින් හඳුනා ගන්න, එවා අතර දක්නට ලැබෙන වෙනස්කම් 5 බැගින් ලියන්න.

2) තෘණ සංරක්ෂණය කොට, රළු තෙත් ආහාරයක් හා රළු වියළි ආහාරයක් ලෙස ගැනෙන සයිලේජ් (silage), හා හේ (hay), නිෂ්පාදන කියාවලිය සැකෙවින් දක්වන්න.( රූපසටහන් සහ නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු සඳහා අන්තර්ජාලය භාවිත කරන්න.)

3) පෝෂ තෘණ , ගෝචර තෘණ යනු හඳුන්වන්න.

4) සත්ව ආහාර වශයෙන් (ගව) කොළ අතු ලෙස භාවිතා කළ හැකි ශාක වර්ග 5 ක් නම් කරන්න .

## 8.4 ගව පාලනය

'මෙහිදී කිරිගව පාලනය පිළිබඳ වැඩි අවධානයක් යොමු කරනු ලබයි. කිරි නිශ්පාදනය කෙරෙහි දේශගුණය, නිවාස, සත්ව පෝෂණය, ආදිය බලපානු ලබයි."

### 8.4.1. ගවයින් ඇති කිරීමේ ක්‍රම.

ලංකාවේ ගවයින් ඇති කරන ප්‍රධාන ක්‍රම 3 නම් කොට, ඒවා කෙටියෙන් හඳුන්වන්න. (වගුවක් භාවිතා කරන්න.)